# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2487/35 - 2026 මැයි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2026.05.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/17/2020/D/185.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : ප්‍රාලේ/අක්/5/09/21.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ / පරවශතාවේ විස්තරය* :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 134ඩී, බඹරගොඩ ග්‍රාම නිලධාරි වසමේ පනාගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කැ. සි. අ. 810252 හි කලාප අංක 03 පත්‍ර අංක 1 හා 2025.10.17 දිනැති පිඹුරේ පෙන්නුම්කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.4011ක් වූ පහත විස්තර කරන ඉඩම් කැබලි අංක 1 හා 3:

**01. කැබලි අංකය 01**
ඉඩමේ නම: වලහන්දුව වත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 20-30ක් වයසැති මිශ්‍ර බෝග වගාවක් සහ ස්ථිර ගොඩනැගිලි 10ක් ඇත.; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; මුල් හිමිකම් කියන අය: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.8911.

**02. කැබලි අංකය 03**
ඉඩමේ නම: වලහන්දුව වත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 20-30ක් වයසැති මිශ්‍ර බෝග වගාවක්, ස්ථිර ගොඩනැගිලි 10ක් ඇත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; මුල් හිමිකම් කියන අය: සභාපති, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 1.5100.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.07.22 වැනි දින පෙ.ව. 10.00ට අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2026.07.15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**ටී. ජී. එස්. සජීවනී,**
ප්‍රාදේශීය ලේකම්,
අක්මීමන.

2026 අප්‍රේල් මස 17 වැනි දින,
අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05 - 0041


1A - G 046743 – 15 (2026/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*